ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්
இலங்கை கனிப்பொருள் மணல் லிமிடட்
LANKA MINERAL SANDS LIMITED



වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2020

දැක්ම

“ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ නිෂ්පාදකයින්

අතරින් ජාතික ආර්ථිකයට ප්‍රමුඛතම

දායකත්වය ලබා දෙන්නා බවට පත්වීම ”



මෙහෙවර

“හරිත සංකල්පය යටතේ දේශීය හා

විදේශීය ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවයන්

සපුරාලීම සහතික කිරීම සඳහා නවීන

තාක්ෂණය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ

සංවර්ධනයට උපරිම දායකත්වය ලබාදීම ”

පටුන

ආයතනික තොරතුරු	01 - 02
සභාපතිවරයාගේ පණිවුඩය	03
අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව	04 - 07
මූල්‍ය ඉස්මතු කිරීම්	08 - 09
විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව	10
විගණකාධිපතිතුමාගේ වාර්තාව	11 - 24
මූල්‍ය ප්‍රකාශන	25 - 48

ආයතනික තොරතුරු

නම	:	ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්
නෛතික ස්වභාවය	:	පූර්ණ වශයෙන් ශ්‍රී ලංකා රජයට අයත් සීමිත වගකීම සහිත සමාගමකි.
සමාගම් ලියාපදිංචි අංකය	:	PB 587
ලියාපදිංචි කාර්යාලය	:	අංක 341/21, සරණ මාවත, රාජගිරිය
අධ්‍යක්ෂකවරු	:	මුදිත විජේසිංහ මහතා - සභාපති එම්.පී. සුනිල් මහතා - අධ්‍යක්ෂ ආර්.එම්.පේ. උදයකුමාර මහතා - අධ්‍යක්ෂ ආර්.එච්.රංජිත් උපාලි මහතා - අධ්‍යක්ෂ රංජන් අතුකෝරල මහතා - අධ්‍යක්ෂ පී.බී.ඒ. සංජීව - අධ්‍යක්ෂ ටී.එන්. ඔසේන් - අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත)
කළමණාකාර කණ්ඩායම	:	කේ.ටී.යූ.එස් ද සිල්වා මහතා - සාමාන්‍යාධිකාරී B.Sc. MSc(Geological) එස්. ඥානේස්වරන් මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී B.Sc. Eng. AMIESL (යන්ත්‍රාගාර/මෙහෙයුම්) එච්.බී.එන්.ඩබ්ලිව්.අනුර කුමාර මහතා - වැ.බ.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී B.A. High. Dip in Pilosopy (මානව සම්පත් හා පරිපාලන) High. Dip in Counseling,Dip in Quality Control,Dip at NIBM සුජීවා කාරියවසම් මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී L.I.C.A.,Dip.in Accountancy (මූල්‍ය) ආවරන Dip.in (Com), Dip.in HRM එම්. ඒ.අයි.පී. ජයතිලක මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක L.I.C.A. ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී.ඩබ්ලිව්. කුමාර මහතා - සැපයුම් කළමනාකරු B.Sc. පී.බී.එම්.විජේබණ්ඩාර මහතා - අලෙවි කළමනාකරු B.Sc.

ආයතනික තොරතුරු

විගණකවරු : විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
නො. 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

බැංකුකරුවෝ : ලංකා බැංකුව
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

ලේකම්වරු : කෝපරේට් එෆෙයාර්ස් (පුද්ගලික) සමාගම
68/1 ඩෝසන් වීදිය
කොළඹ - 02

සභාපතිතුමාගේ පණිවිඩය

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් (LMSL) 1957 සංස්ථාවක් ලෙස ආරම්භ වී 1992 දී සීමිත වගකීම් සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති අතර අද දක්වාම බනිජ කර්මාන්තය පදනම් කරගත් අද්විතීය සමාගමක් ලෙස පරිණාමීය ගමන දෙස ආපසු හැරී බලන විට බොහෝ දේවල් වලින් අපට සතුටු විය හැකිය. සමාගම ලබා ඇති සාර්ථකත්වයන් දෙස අප බලන විට ශක්තිමත් පදනමක් දමා ඇති අතර පරිසර පද්ධතියේ සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සංවර්ධනයක් කරා යාමට සමාගමට හැකි වනු ඇති බව මා හට විශ්වාස කළ හැකිය.

කොවිඩ් 19 වසංගත කාල සීමාව තුළ නිෂ්පාදන ක්‍රියාවලිය බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා LMSL කණ්ඩායම ලබා දුන් දායකත්වය මම අගය කරමි.

වසර තුළ කෝකිලායි බනිජ වැලි කැණීමේ බලපත්‍රයට අදාළ බොහෝ කටයුතු අවසන් කිරීමට ප්‍රගතිශීලි පියවර ගෙන ඇත.මීට අමතරව නිෂ්පාදන ඉලක්ක ඉහළ නැංවීම සඳහා නව බනිජ වැලි සැකසුම් කම්හල කෝකිලායි හි ස්ථාපිත කිරීමටද මූලික කටයුතු සූදානම් කර ඇත.

කෝකිලායි බනිජ වැලි කැණීමේ බලපත්‍රය ලබා ගැනීම LMSL වෙත වඩාත් වැදගත් වනු ඇත. එය LMSL හි අනාගතයේ හැරවුම් ලක්ෂයක් ලෙස සලකනු ඇත.

කෝකිලායි බනිජ වැලි සැකසුම් කම්හල පිහිටුවීමෙන් පසු යෝජිත බනිජ වැලි අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

බනිජ වැලි සඳහා අගය එකතු කිරීම LMSL හි ප්‍රධාන අරමුණ වනු ඇති අතර එමගින් රටේ අය වැය හිඟය පිරවීම සඳහා සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ගත හැක.

LMSL සමාගම බනිජ වැලි කර්මාන්තයේ විභව සංවර්ධනය සඳහා යොමු වන අතරම ගැටළු විසඳීමට බාධාකාරී සාධක සහ බාධක හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

2020 වසර තුල LMSL හි කාර්ය සාධනය සඳහා ඕනෑම අභියෝගයකට මුහුණ දීමට අපි සුභවාදීව සහ විශ්වාසයෙන් යුතුව අනාගතය දෙස බලා සිටිමු. 2020 දී LMSL හි අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ,සියළුම මාණ්ඩලික නිලධාරීන් සහ LMSL අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය සහ සියළුම සේවකයින්ගෙන් ලද මග පෙන්වීම, සහයෝගය මම ඉතා අගය කොට සලකමි.

LMSL හි ඉදිරි කටයුතු සාර්ථක වේවායි පතමි.

සභාපති
මුදිත විජේසිංහ

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි අධ්‍යක්ෂකවරුන් විසින් 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කල මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරනු ලැබේ.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි සාංගමික ව්‍යවස්ථාවලියෙහි දැක්වෙන පරිදි ප්‍රධාන අරමුණු වන්නේ

1. බර බණිජ වැලි කැණීම්,වෙන් කිරීම්, පිරිපහදුව හා සැකසුම
2. වෙරළාශ්‍රිත බර බණිජ වැලි උපයෝගී කරගෙන වාණිජමය හෝ කාර්මික වටිනාකමක් ඇති ද්‍රව්‍ය හෝ ඒ ආශ්‍රයෙන් නිපදවිය හැකි කුමන හෝ ද්‍රව්‍යයන් නිපදවීම හා අලෙවි කිරීම.
3. වෙරළාශ්‍රිත බර බණිජ වැලි පිරිපහදුවේදී හෝ සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස නිපදවන කුමන හෝ අතුරු ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය.

නිෂ්පාදනය

මෙම වර්ෂයේ නිෂ්පාදනයන් මෙට්‍රික් ටොන් වලින් -

ඉල්මනයිට්	15,419
රූටයිල්	1,311
සර්කෝන්	419
හයි. ටයි. ඉල්මනයිට්	2,597
නන් මැග්නටික් හෙවි මිනරල් කන්සන්ට්‍රේට්	7,523
ස්පයිරල් ප්ලාන්ට් ෆයින්ස් කන්සන්ට්‍රේට්	---
සර්කෝන් ක්‍රූඩ්-පහළ ශ්‍රේණිය	19,127
ක්‍රූඩ් මොනසයිට්	18
මැග්නටයිට්	55
සර්කෝන් ක්‍රූඩ්-ඉහළ ශ්‍රේණිය	8,469
නිව් වෙට් ටේබල් ටේලින්ග්ස්	9,656
ස්ක්‍රීන් ඔවර්සයිස් කන්සන්ට්‍රේට්	559
හයිඩ්‍රොසයිසර් ෆයිනස්	1,936
	67,089

විකුණුම්

බනිජවැලි මෙ.ටො.14,955 ක් අලෙවි කිරීම මගින් ආයතනය රු.මි.697 ක් උපයා ගෙන ඇත.

	මෙ.ටො	රු.මි
ඉල්මනයිට්	10,488	263
රූටයිල්	1,000	227
සර්කෝන්	466	104
හයි ටයි ඉල්මනයිට්	3,000	103
	14,954	697

ප්‍රතිඵල

සමාගමේ බදු පසු ලාභය රු.මිලියන 69 කි.

		රු.මි.
	2020	2019
දළ ආදායම	697	3,891
දළ ලාභය	388	2,816
ශුද්ධ ලාභය	69	1,928

දේපළ, පිරියත හා උපකරණ

සටහන් අංක 12 හි විස්තරවලට අනුව 2020 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල ලියාහල අගය එහි මූලික පිරිවැය වූ රු. මිලියන 2,128 න් සියයට 51 ක් (51 %) පමණ විය. කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල අගය මිලියන 84 කි. මෙය යන්ත්‍ර හා යන්ත්‍රාගාර ප්‍රතිස්ථාපනය සඳහා වූ පැහැදිලි දර්ශකයක් වේ. යන්ත්‍ර හා යන්ත්‍රාගාර ප්‍රතිස්ථාපනය හා වැඩි දියුණු කිරීමට සංචිතයක් නිර්මාණය කර ඇත.වර්ෂ කිහිපයකට කලින් නිදන් අරමුදලක මුදල් ආයෝජනය කර තිබුණි. කෙසේ වුවත්, 2012 වර්ෂයේ ලාභාංශ ගෙවීමට අදාල අරමුදල පාවිච්චි කරන ලදී. එම නිසා නිදන් අරමුදල ගිණුම් වලින් ඉවත් කරන ලදී.

ස්ථාවර වත්කම් වලට වර්ෂය තුළ එකතු කිරීම් රු. මිලියන 253 ක් විය.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

රු.මි. 800 ක ප්‍රකාශිත ප්‍රාග්ධනය නොවෙනස්ව පැවතුනු අතර, භාණ්ඩාගාර ලේකම් විසින් සියළුම කොටස් දරයි. විස්තර සටහන් අංක 23 හා සම්බන්ධ වේ.

අත්තිකාරම්

කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට රු. මිලියන 500 ක් 2012 වර්ෂය තුළ අත්තිකාරම් මුදලක් ගෙවන ලද අතර,අද වන තෙක් නැවත ලැබී නැත. මෙම මුදල හා ලැබිය යුතු (උපචිත) පොළිය රු.මි.517 න් සියයට 10 ක් (10%) බොල් හා අඩමාන ණය සඳහා වෙන්කර තබන ලදී.

කෙටිකාලීන මූල්‍ය වත්කම්

කෙටි කාලීන මූල්‍ය වත්කම් රු.මි. 2,648 සිට රු.මි.2,392 දක්වා අඩු විය.

කෙටිකාලීන ණය

මූල්‍ය කල්බදු පහසුකම යටතේ ලංකා බැංකුවෙන් අවුරුදු 4කින් ගෙවීමේ පදනමට වාහන 4 ක් අත්පත් කර ගන්නා ලදී. 2020.12.31 දිනට ගෙවිය යුතු මුදල රු.මි 20 කි.

බදුකරණය

වර්ෂයේ සාමාන්‍ය හා අපනයන බදු ප්‍රතිශතය 14% කි.

කොටස් තොරතුරු

කොටසක මූලික ඉපයීම 2019 වර්ෂයේ රු. 24.10 ට සාපේක්ෂව 2020 වර්ෂයේදි රු.0.86 දක්වා අඩු විය.

අනාගත සැලසුම්

සමාගමේ අනාගත සැලසුම් නම්,

- නව බනිජ නිධි අලුතින් හඳුනා ගැනීම
- පොඩුවාකට්ටු,තෙවික්කල්ලු,කෝකිලායි කොක්කුතුඩුවායි ,පුල්මුඩේ, නයාරු,ගවේෂණ බලපත්‍ර ලබා ගැනීම.
- කෝකිලායි කැනීම් බලපත්‍රය ලබා ගැනීම.
- කැනීම් කල ප්‍රදේශ කැනීම් කල පසු කාලයක් වෙන් කර ගැනීම
- පුද්ගලික හා රජයට අයත් ඉඩම් කැනීම සඳහා ලබා ගැනීම
- ගබඩා පහසුකම් - ගබඩා සැලසුම් කිරීම හා ඉදි කිරීම
- නිවාස යෝජනා ක්‍රමය සඳහා ජල පිරි පහදුවක් සැලසුම් කිරීම සහ ඉදි කිරීම
- ජල සැපයුම් පද්ධතිය පද්ධතියට ස්වයංක්‍රිය කිරීම
- නව පරිඝනක කලමනාකරන පද්ධතියක් හඳුන්වාදීම (ERP)
- විදුලි හා විදුලි බෙදා හැරීමේ පද්ධතිය නවීකරණය කිරීම
- ඩ්‍රයි මිල් යන්ත්‍රාගාරය සඳහා LV පැනලයක් සැපයුම් කිරීම,ලබා ගැනීම හා සවි කිරීම
- යාන්ඔය ජල පොම්පාගාරය සඳහා නව LV පැනලයක් සැපයුම් කිරීම හා ලබා ගැනීම හා සවි කිරීම සහ ස්වයංක්‍රිය පාලන පද්ධතියක් ඇති කිරීම
- කෝකිලායි උතුරු ප්‍රදේශයේ නව බනිජ සැකසුම් යන්ත්‍රාගාරය ඉදි කිරීම

  නව රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීම
- නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම
- නව අලවිකරන මාර්ගෝපදේශයන් හා පද්ධතිය වැඩි දියුණු කිරීම
- වෙරළ ගවේෂණය බලපත්‍ර ලබා ගැනීම
- පුහුණු හා සංවර්ධන සැලැස්මක් හඳුන්වාදීම
- මූල්‍ය, පරිපාලන හා විනය සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ සකස් කිරීම
- නව කැනීම් ප්‍රතිපත්තියක් හා කැනීම් සැලැස්මක් හඳුන්වාදීම
- පරිසර කලමනාකරන පද්ධතියක් පිලියෙල කිරීම
- අපද්‍රව්‍ය කලමනාකාරන ප්‍රතිපත්තියක් හඳුන්වාදීම
- ආයතනයට කයිසන් සංකල්පය හඳුන්වාදීම

මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසු ඇතිවූ සිදුවීම්

රු.මිලියන 100 බැංකු අයිරා පහසුකම ලංකා බැංකුවෙන් ලබා ගත්තද එය 2020 වර්ෂය තුළ ප්‍රයෝජනයට නොගැණුනි.මූල්‍ය තත්ව ප්‍රකාශණ දින සිට වෙනත් කිසියම් ගැලපිය යුතු කරුණක් සිදුවී නොමැත.

රැකියා ප්‍රතිපත්ති

2020.12.31 වන දිනට සේවකයින් සංඛ්‍යාව 662 ක් විය. වර්ෂය තුළදී කළමනාකරණය විසින් මානව සම්පත් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

ව්‍යවස්ථාපිත ගෙවීම්

සේවකයින්ට සහ රජයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් අදාල දිනට නිම කර ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම සහ විශ්වාසයට අනුව සෑහීමකට පත් විය හැකිය.

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම

අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ කිසිදු කොටසක් සඳහා හිමිකමක් නොදරයි. මුළු කොටස් හිමිකම (100 %) මහා භාණ්ඩාගාරයේ ලේකම් සතුවේ.

සංස්ථාපිත සමාජ වගකීම

සංස්ථාපිත සමාජ වගකීම් ඉටුකිරීම සඳහා සමාගම විසින් රු.මි 1.3 ක් වැය කර ඇත. සමාජ සුභසාධන කටයුතු සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම, ආගමික කටයුතු, අධ්‍යාපනික කටයුතු ආදිය මේ යටතේ සිදුකර ඇත.

ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

සමාගම සමඟ ඇතිකරගත් කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුම් තුළ අධ්‍යක්ෂවරුන්ගේ සෘජු හෝ වක්‍ර බැඳීමක් නොමැත.

සාංගමික යහපාලනය/අභ්‍යන්තර පාලනය

සමාගමෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරුන් විසින් දරනු ලබයි. වත්කම් ආරක්ෂා කිරීම, උචිත ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සහ විශ්වාසනීය මූල්‍ය තොරතුරු උත්පාදනය සහතික කිරීම සඳහා සමාගමේ පාලන පද්ධතිය නිර්මාණය කර ඇත. කෙසේ වුවත්, ඕනෑම පද්ධතියකට හැකි වන්නේ සාධාරණ සහතික කිරීමක් ලබාදීම පමණක් වන අතර, වැරදි හා අක්‍රමිකතා වැළැක්වීම හෝ සාධාරණ කාලයක් තුළ ඒවා හඳුනා ගැනීම පිළිබඳ නිරපේක්ෂ සහතිකයක් ලබා දිය නොහැක.

මූල්‍ය ප්‍රකාශන කට්ටලය අත්සන් තබන දින දක්වා අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම උපයෝගී කරගෙන ඇත.

විගණකවරුන්

2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වසර සඳහා බාහිර විගණකවරුන් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

ලේකම්වරුන්


සී/ස කෝපරේට් එෆෙයාර් පුද්ගලික සමාගම සමාගම් ලේකම් ලෙස කටයුතු කරන ලදී.
අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි
කෝපරේට් එෆෙයාර් පුද්ගලික සමාගම

පසුගිය වර්ෂ පහ සඳහා වැදගත් මූල්‍ය තොරතුරු

		2016	2017	2018	2019	2020
දළ විකුණුම් ආදායම	- රු.මි.	1,174	1,424	1,542	3,891	697
දළ ලාභය	- රු.මි.	607	953	1,056	2,816	388
වෙනත් ආදායම්	- රු.මි.	55	134	124	154	313
බද්දට පෙර ලාභය	- රු.මි.	170	535	622	2,278	(51)
බද්දට පසු ලාභය	- රු.මි.	154	474	516	1,928	69
අන්තර්ග්‍රහනය නොකල පොදුකාර්ය වියදම්	- රු.මි.	305	325	326	407	550
මුළු වත්කම්	- රු.මි.	3,100	3,489	3,945	5,295	5,422
මුළු වගකීම්	- රු.මි.	556	1,216	933	1,940	2,034
කොටස් හිමියන්ගේ හිමිකම්	- රු.මි.	2,544	2,309	3,012	3,354	3,387
ආදායම් බදු	- රු.මි.	16	54	65	280	---
භාණ්ඩාගාරය සඳහා ලාභාංශය	- රු.මි.	54	161	180.7	670.3	---
සේවක සංඛ්‍යාව		685	695	656	645	662
ශුද්ධ ලාභ අනුපාතය		14%	37%	40%	59%	…
ආයෝජන මත ප්‍රතිලාභය		34%	59%	64%	241%	….
ප්ංගම අනුපාතය		4:1	2:1	3:1	2:1	2:1

ක්ෂණිකව බැලීමේදී

රු .මිලියන



විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

2002 යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව ස්ථාපිත කල යුතු විගණන හා කළමනාකරණ කමිටුව 2018 සැප්තැම්බර් මස 25 වන දින පත් කරන ලදී.

කෙසේ වුවද 2019 සිට 2020 දක්වා පවතින තත්ත්වය තුල පහත සඳහන් නිලධාරීන්ගෙන් සමනවීත වන පරිදි විගණන හා කළමනාකරණ කමුිව පත් කරන ලදී.

1. ටී.එන්.ඔෂේන් මයා - සභාපති
   මහා භාණ්ඩාගාර නියෝජිත
   (අධ්‍යක්ෂ - ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්)
2 ආර්.එන්.පේ. උදය කුමාර - සාමාජික
   (අධ්‍යක්ෂ -ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්)
3 ආර්.එච්.ආර්. උපාලි මහතා - සාමාජික
   (අධ්‍යක්ෂ- ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්)

සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටුව හතරවරක් රැස්විය. අභ්‍යන්තර විගණන කාර්තුමය වාර්තා පිළිබඳ ගැඹුරින් සාකච්ඡා කරන ලද අතර ජාතික විගණන කාර්යාලයෙන් වරින් වර නිකුත් කරන ලද විගණන විමසුම හා වාර්තා සාකච්ඡා කර අවශ්‍ය උපදෙස් හා තීරණ කළමනාකරණය වෙත ලබාදුන් අතරම වැඩිදුර සාකච්ඡා කර තීරණයන් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.
නිරීක්ෂකයන් ලෙස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හා ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ද සහභාගි වන ලදී.

එමෙන්ම විගණන කමිටුවට අමතරව කළමනාකරණ තොරතුරු හා ගැටලු පිළිබඳ කමිටුවට ඉදිරිපත් කරන ලද කරුණුද වැඩි දුර සාකච්ඡා කරමින් අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

ටී. එන්. ඔෂේන් මයා
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMU/A/LMSL/FA/2020/12 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 සැප්තැම්බර් 28 දින

සභාපති

ලංකා බණිජවැලි සමාගම

ලංකා බණිජවැලි සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා බණිජවැලි සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 කන්ත්වාගණනය කළ මිතය සඳහා පදනම

(අ) ආයතනයක් විසින් පෙර කාලපරිච්ඡේදයට අදාළව ප්‍රමාණාත්මක වැරදි පසුයා ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 8 හි 42 වගන්තිය ප්‍රකාරව ඒවා අතීතානුයෝගීව නිවැරදි කළයුතු වුවත් සමාගම විසින් 2019 අගෝස්තු 12 දින මිල දී ගෙන එම වර්ෂයේදීම භාවිතයට ගෙන තිබූ රු.71,565,328ක් වටිනා Wet High Intensity Magnetic Separator With a Control panel Board යන්ත්‍රය 2020 වර්ෂයේ මිල දී ගත් යන්ත්‍රයක් ලෙස ගිණුම්වලට ගෙන 2019 වර්ෂයට අදාළ රු.2,981,890 ක් වූ ක්ෂය වීම පෙර වර්ෂයේ ලාභයට නොගලපා 2020 වර්ෂයේ වාර්ෂික ක්ෂය වීම වලට එකතු කර ගලපා තිබුණි.

(ආ) දේපල, පිරියක හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 වන ඡේදයට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර ඵලදායී ජීව කාලය කලින් ඇස්තමේන්තු වලට වඩා වෙනස් නම්, වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 8 අනුව ගිණුම්ගත කළ යුතු වුවත්, සම්පූර්ණයෙන් ක්ෂය වී ඇතත් දැනට භාවිතයේ පවතින පිරිවැය රු.175,746,070 ක්වූ ලෝඩර් වාහන හා පිරිවැය රු. 45,294,704 ක්වූ ගොඩනැගිලි වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී කිසිදු අලෙවියක් සිදු වී නොමැති ඛනිජ වර්ග කිහිපයක අවසන් තොග භෞතික සත්‍යාපනයේදී පෙත් ශේෂය හා භෞතික ශේෂය අතර මෙ.ටොන් 4,991 සිට මෙ.ටොන් 1,274 ක පරාසයක අතිරික්ත හා ඌනතා වෙනස්කම් ඇතිවී තිබුණි. තොගයන්හි ඇතිව තිබූ එම වෙනස්කම් වලට හේතු හඳුනාගැනීමකින් හා විධිමත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව තොගයට ගැලපීම් කර එයට අදාල නොවන නිෂ්පාදන පිරිවැයක් පාදක කර ගිණුම් වලට ගැලපීම් හේතුවෙන් අවසන් තොගය හා වර්ෂයේ ලාභය රු.40,277,578කින් වැඩි වී තිබුණි.

(ඈ) ඉල්මනයිට් සඳහා ලබාගන්නා දළවැලි අවසාන තොගය මෙ. ටොන් 151,762ක් වූවද ගිණුම් ගත කර ඇති ප්‍රමාණය මෙ.ටොන් 149,065ක් විය. ඒ අනුව මෙ.ටොන් 2,696 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් දළවැලි අවසන් තොග වටිනාකම රු.1,058,233 ක් අඩුවෙන් හා B යන්ත්‍රාගාරයේ නිෂ්පාදන පිරිවැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ කන්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත සඳහනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොඇලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැන්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැන්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ යහාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් -ක්‍රියාදාම කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැඩීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සාර ඛවව සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එනි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වෙනනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබඳ යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන උභයන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තක්ස්වාගණන මතය සඳහා පදනම් ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණ වලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් තැති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 2015 ජූලි 10 දිනැති අංක. 02/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය	අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු බව සඳහන් වුවද වසර 2න් වසර 10න් අතර කාලයක සිට ධාවනයෙන් ඉවත් කර ඇති සමාගම සතු වාහන 08 ක් අපහරණය කිරීමට කිසිදු කටයුතු කර නොතිබුණි.
(ආ) 2020 ජනවාරි 27 දිනැති අංක. 1/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ක්ෂේත්‍ර 6ක් යටතේ අධ්‍යක්ෂවරු 3දෙනා බැගින් උපකමිටු පත්කර, පුල්මුඩේ ක්ෂේත්‍ර සංචාරය වෙනුවෙන් රු.200,000ක් ගෙවා නිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා මාසික දීමනාව රු.25,000 ඉක්මවිය නොහැකි බව සඳහන් වුවද චක්‍රලේඛ ප්‍රතිපාදන වලට පටහැනි රැස්වීම් සඳහා සහභාගි වූ දෙදෙනෙකුට එම සීමාව ඉක්මවා රු.60,000ක් බැගින් දීමනා ගෙවා තිබුණි. ක්ෂේත්‍ර සංචාරය කිරීම වෙනුවෙන් කිසිදු වාර්තාවක් මෙම නිලධාරීන් විසින් සමාගමට ලබා දී නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රශම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2020 වර්ෂය තුල සමාගමේ අපේක්ෂිත මුළු වාණිජ විකුණුම් ප්‍රමාණය මෙ.ටොන් 113,996 ක් හා එහි විකුණුම් වටිනාකම රු.4,660,524,000ක් වූවත් සත්‍ය විකුණුම් ප්‍රමාණය මෙ.ටොන් 14,955 ක් වූ අතර එහි විකුණුම් වටිනාකම රු.696,597,134 ක් විය. ජාත්‍යන්තර තරඟකාරී ලංසුකරණය යටතේ ඉදිරිපත්වන ගැණුම්කරුවන් සීමිත වීම, විවිධ හේතූන් මත ටෙන්ඩර් අවලංගු වීම, එකවර විශාල තොගයක් අලෙවි කිරීමට නටයුතු නිරීම වැනි හේතූන් නිසා මෙලෙස අපේක්ෂිත ඉලක්ක කරා ලඟාවීමට නොහැකිවී තිබුණි. මෙලෙස ක්‍රමවත් ලෙස සමාලෝචිත වර්ෂයේදී විකුණුම් සිදුනොවීමෙන් පායනනයේ මූල්‍ය තත්ත්වය අයහපත්වී ද්‍රවශීලතාවය අඩුවීමෙන් දෛනිකා අවශ්‍යතා සඳහා කිහිප අවස්ථාවකදී රු. 450,000,000ක් වූ ස්ථාවර තැන්පතු රක් කල් පිරීමට පෙර ආපසු මුදල් කර ගැනීම හේතුවෙන් රු. 7,573,770 ක අපේක්ෂිත පොලී ආදායම අහිමිවී තිබූ අතර කොවිඩ 19 වසංගත තත්ත්වය හමුවේ අපේක්ෂිත අලෙවිය සිදු නොවීම මෙන්ම තොග ඉවත් නොවීමෙන් ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හා තොග සංරක්ෂණය දුර්වලවීම වැනි ගැටළු රැසකට සමාගම මුහුණදී තිබුණි.

(ආ) ඉල්මනයිට් මෙ.ටොන් 85,000ක ටෙන්ඩරය සඳහා ලංසු 4ක් ලැබී තිබූ අතර මෙ.ටොන් 01 කට ඇ.ඩො. 165.20 ක ඉහලම මිල ලංසුව නිසි වගකීමකට බැඳුනු ලංසු සුරක්ෂණයක් කොවින බව දක්වමින්ද , ඇ.ඩො.163 ඉදිරිපත් කළ දෙවන මිල ලංසුව මෙ.ටොන් 5,000ක් සඳහා පමණක් බව දක්වමින්ද ප්‍රතික්ෂේප කර තිබුණි. පසුගිය වසරේ මුල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද එම වාර්තා ඉදිරිපත් කර නොතිබීයදීත් තෙවන මිල ඇ.ඩො. 147 කට එකඟ වූ ලංසු කරුට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. මේ නිසා ඉහලම මිල ඉදිරිපත් කළ ලංසුකරුට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට එකඟතාවයකට පත් නොවීමෙන් මෙ.ටොන් 01 කට ඇ.ඩො.18.20 බැගින් මෙ.ටොන් 85,000කට ඇ.ඩො.1,547,000 ක පාඩුවක් ආයතනයට සිදුවී තිබුණි.ඇ.ඩො.147 බැගින් මෙ.ටොන් 85,000 දින 130 ක් ඇතුලත නිදහස් කිරීමට එකඟව 2020 ඔක්තෝම්බර් 28 දින ඉල්මනයිට් විකිණීමේ ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණද මෙ.ටොන් 25,000 කට ඇ.ඩො. 3,675,000ක් ගෙවා සමාලෝචිත වර්ෂය අවසානයට මෙ.ටොන් 5,032.86 ක් හා 2021 මාර්තු අවසන් වන විට තවත් ඇ.ඩො.2,940,000 ක් ගෙවා 30,000 ක පමණ ප්‍රමාණයක් ඉවත් කර ගෙන තිබුණි. ඇ.ඩො. 5,880,000 ක්[illegible] මුදල 2021 මාර්තු අවසන් වන තෙක් ගෙවා නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් වසර 30ක බද්දකට රු. 24,220,118 ක් ගෙවා බනිජ වැලි සමාගමේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී ලබාගෙන තිබුණි. වර්ග අඩි 15,325 ක මහල් 06 කින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.171,453,486 කට (වැට රහිත) 2018 මාර්තු කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.6 වගන්තිය ප්‍රකාරව ලංසුකරුවකු විසින් ඉදිරිපත්කරන ලද ලංසුව ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු වහාම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කල යුතු වුවත් කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුම අත්සන් කර නීතිමය බැඳීමක් ඇතිකරගෙන තිබුණේ 2020 පෙබරවාරි 26 දින එනම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වසර 02ක් ගතවීමෙන් පසුව විය. එහෙත් මෙම ගිවිසුමට කොන්ත්‍රාත් පිරිවැය, ගෙවීම් කොන්දේසි , කොන්ත්‍රාත් කාලය වැනි ප්‍රධාන පිරිවිතරයන් ඇතුලත් කර නොතිබුණි.

2020 මාර්තු ගොඩනැගිල්ල ඉදිකිරීම් ආරම්භ කර තිබූ අතර වසර 07 ක කාලයක් මෙම ඉඩම නිෂ්කාර්යව පැවතී තිබුණි. වසර 30ක බදු කාලයෙන් 2020 මාර්තු අවසන් වන විට වසර 8ක් ගෙවී ඇති මුත් මහල් 06 කින් යුත් මෙම ගොඩනැගිල්ලේ මහල් 04 ක් ඉහලට නැංවීම සම්පූර්ණ කිරීමට හැකිවී තිබුණි.

(ඈ) 2018 අගෝස්තු 15 සිට 2028 අගෝස්තු 15 දක්වා වසර 10 ක් සඳහා තෙවික්කල්ලිය ප්‍රදේශයේ හෙක්ටයාර් 4.5 ක වපසරියකින් යුක්ත වූ භූමියෙහි බනිජ වැලි කැනීම් කිරීම සඳහා බලපත්‍ර ලබාගෙන තිබුණද, 2021 මාර්තු වන විටත් එහි කැනීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ෘ) සමාගමේ දැනට පවතින Block A යන්ත්‍රාගාරයේ උපරිම ධාරිතාවය ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් රු.39,481,066 ක මුදලක් වැයකර 2014 වර්ෂයේදී ආරම්භකර 2017 වර්ෂයේදී Block A නව යන්ත්‍රාගාරයේ ඉදිකිරීම් අවසන් කර තිබුණි. එහි ස්ථාපිත කිරීම සඳහා 2012 වර්ෂයේදී මිලදී ගත් රු.179,229,302 ක් වටිනා යන්ත්‍ර සුත්‍රද, කෝකිලායි ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදිගත් යන්ත්‍ර කොටස්ද මෙම යන්ත්‍රාගාරයේ සවිකර තිබුණද, 2019 ඔක්තෝම්බර් සිට විගණිත දිනය වූ 2021 අප්‍රේල් 30 දින වන විටත් මෙම යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු සිදුකර නොතිබුණි.

(ඊ) 2013 වර්ෂයේදී බනිජ වැලි බහුලව පවතින හෙක්ටයාර් 17.6 ක පිළි ප්‍රමාණයක් කෝකිලායි ප්‍රදේශයෙන් සමාගම විසින් අත්පත් කරගෙන ඒ සඳහා රු.මිලියන 2.25 ක මුදලක් මුලතිව් දිස්ත්‍රික් ලේකම් වෙත 2012 වර්ෂයේදී ගෙවා තිබුණු අතර එම වර්ෂයේදීම කෝකිලායි ව්‍යාපෘතිය වෙනුවෙන් යන්ත්‍රසුත්‍ර මිලදී ගැනීම සඳහා රු39,339,473 ක් ද වැයකර තිබුණි. කැනීම් කිරීම සඳහා අවශ්‍ය කැණීම් බලපත්‍රය ලබාගෙන නොතිබීම මත සමාලෝචිත වර්ෂය දක්වාම එම ප්‍රදේශයේ කිසිදු කැනීම් කටයුත්තක් කර නොතිබුණි. තවද ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් වත්කම් සියල්ල

පූල්මුඩේ යන්ත්‍රාගාරයේ වෙනත් ස්ථානවල ස්ථාපිත කර නිෂ්කාර්යව තිබුණු අතර ඇකැමී යන්ත්‍ර ගබඩාවේ නිෂ්කාර්යව ගොඩ ගසා තිබුණි. මෙම යන්ත්‍රවලින් ස්ෂයිරල් 24 ක් Block A පැරණි යන්ත්‍රාගාරයේ සවිකර තිබුණ ද ඒවාද ක්‍රියාකාරී තත්වයේ නොතිබුණි. එසේම 2015 වර්ෂයේදී කෝකිලායී ව්‍යාපෘතිය සඳහා සේවකයින් 117 දෙනෙකු බඳවාගෙන ඔවුන් යන්ත්‍රාගාරයේ විවිධ ස්ථාන වලට අනුයුක්ත කර තිබුණි. ඒ අනුව අතිරික්ත සේවක සංඛ්‍යාවක් පැවතීමෙන් නිෂ්පාදන වල පිරිවැය ඉහළ යාමට එයද බලපා තිබුණි.

(ඇ) Block A පැරණි යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය දළ වැලි යෙදවුම් පැයකට මෙ. ටොං. 100 ක් වුවද වර්තමාන ධාරිතාවය පැයට මෙ.ටොං. 40 හා 50 තරම් අඩු අගයක් විය. සූර්ණ ධාරිතාවයට සරිලන පරිදි යෙදවුම් යොමු නොකිරීම නිසා ලැබෙන අඩු නිමැවුම සමස්ථ නිෂ්පාදනාගාරයේම ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපා තිබුණි. මෙම යන්ත්‍රාගාරයේ Spiral නිර්මාණය කර ඇත්තේ අවම බර ඛනිජ වැලි ප්‍රතිශතය සියයට 40 සිට 80දක්වා වන ඛනිජ වැලි වෙන් කිරීම සඳහා වුවක් නියැදිව ලබාගන්නා ලද සාම්පල වලට අදාල 2019 මාර්තු, අප්‍රේල්, සැප්තැම්බර් හා 2020 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස වල පරීක්ෂණ වාර්තා අනුව දින කිහිපයක හැර අනෙක් සෑම දිනකම යෙදවුම් බර ඛනිජ ප්‍රතිශතය සියයට 40ට වඩා අඩු විය.

(ඈ) ඉන්ධන වියදම සියයට 50 කින් ඉතිරිකර ගැනීම සඳහා රු. 62,370,234 ක් වටිනා ඛ්‍රයර් යන්ත්‍රයක් 2016 ජුනි 30 දින ආනයනය කර ඒ සඳහා රු.1,164,350 ක ප්‍රමාද ගාස්තු ඇතුළුව රු.43,838,767ක් 2020 දෙසැම්බර් 31 දින වන විට සමාගම විසින් ගෙවා තිබුණු අතර වසර 5ක් ගතවුවද, මෙම යන්ත්‍රය ක්‍රියාත්මක තත්වයට පත්කර නිෂ්පාදන කටයුතුවලට යොදාගැනීමට 2021 මාර්තු 21 දින වන විටත් සමාගමට නොහැකිවී තිබුණද ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සඳහාගෙන ඔවුනට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාගමේ නිෂ්පාදන කටයුතු විර්ධනය කරගැනීම සඳහා හදිසි මෙන්ම අත්‍යාවශ්‍ය මිලදී ගැනීමක් ලෙස සලකා තෙත වැලි යන්ත්‍රාගාරයට නව Hydroziser යන්ත්‍රය මිලදී ගැනීම සඳහා සමාගම විසින් ඕස්ට්‍රේලියානු මිනරල් ටෙක්නොලොජීස් හි නියෝජිත ශ්‍රී ලාංකීය සමාගමක් මඟින් ආනයනය කිරීමට 2014 වර්ෂයේදී තීරණය කර 2016 ජනවාරි මස රු.15,426,302 කට මිලදීගෙන තිබුණි. මිලදීගෙන වසර 4ක් ගතවුවද, මෙම යන්ත්‍රය නිෂ්පාදන කටයුතුවලට යොදාගැනීමට 2021 මාර්තු 21 දින වන විටත් සමාගම කටයුතු කර නොතිබුණි. ඒ අනුව මෙම යන්ත්‍රය හදිසි අවශ්‍යතාවයන් මත මිලදී ගත් යන්ත්‍රයක් නොවන බව පැහැදිළි වුවද යන්ත්‍රය මිළදී ගැනීම සම්බන්ධයෙන් වගකිව නිවයුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී සමාගම සතුව ආරම්භක හා වර්ෂයේ නිෂ්පාදිත ඉල්මනයිට් තොග පිළිවෙලින් මෙ.ටොං. 77,247ක් හා මෙ.ටොං. 15,419ක් වූ අතර ඉන් ජනවාරි මස මෙ.ටොන් 5,436 ක් හා දෙසැම්බර් මස මෙ.ටොන් 5,053 ක් අලෙවිකර තිබුණි. සමාගම 2020 ඔක්තෝම්බර් මස අලෙවි කළ මෙ.ටොන් 85,000 ක් නිසි පරිදි මුදල් ගෙවා ගැනුම්කරු විසින් ඉවත් කර නොගැනීම් නිසා සමාගම සතු මෙ.ටොං. 60,000ක ඉල්මනයිට් ගබඩා කළ හැකි ගබඩා දෙකෙහි මුළු ධාරිතාවය ඉක්මවා ගොස් තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා යැලකිය යුතු දින ප්‍රමාණයක් ඉල්මනයිට් නිෂ්පාදනය අත්හිටුවා තිබූ අතර 2020 ජූලි 01 සිට විගණිත දිනය වන 2021 මාර්තු 18 දින දක්වාම Block B යන්ත්‍රාගාරයේ නිෂ්පාදනය නවතා තිබුණේ Block C ඇතුළ අනෙකුත් යන්ත්‍රාගාර මෙන්ම සියළු යමපත් එම කාලය දක්වා නිෂ්ක්‍රියව පැවැතිණි.

(ආ) 2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යවසනයෙන් තුල්මුඩේ යාත්‍රාංගණය විනාශවීමෙන් අපූ කොඩිගේ යාත්‍රාංගණයද භාවිතයට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් එහි තිබූ වැඩ හා සියල්ල යාත්‍රා ප්‍රයෝජනයට නොගෙන වසර 16 කට වැඩි කාලයක් දිරා පත්වෙමින් පැවතියද අදාල යන්ත්‍රාගාරය පැවරීමට හෝ අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) වසර 3 ක කාලයක සිට ධාවනයෙන් ඉවත් කර තිබූ වාහන 04 ක ඒම අළුත්වැඩියා කටයුතු අවසන් කර ධාවනය සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ක) ඇඩුවකච්චි සිට බර බනිජ වැලිපුල්මුඩේ යන්ත්‍රාගාරයට ප්‍රවාහනය කිරීම හා ඉඩම් නැවත පිරවීමට සහ වැලි ප්‍රවාහනය සඳහා මෙ.ටොන් 1ක් රු.234ක මිලට වූ ටෙන්ඩරයට ඉදිරිපත් වූ ලංසුකරුවන් 6කගෙන් එක් අයෙකු නෝරා 2020 මැයි 27 දින ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණද එම මිලට ලංසුකරු බනිජ වැලි ප්‍රවාහනය කර නොතිබුණි. එනම් වූ මිලට බනිජ වැලි ප්‍රවාහනය ගනුදෙනුවක් කිරීමට අදාළව ලංසුකරුට එරෙහිව සමාගම කිසිදු ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණු අතර ඉතිරි ලංසුකරුවන්ට වැලි ප්‍රවාහනය කිරීමට අවශ්‍යවූ ලබා නොදී 2020 ජූලි 11 දින සමාගම විසින් මෙ.ටොන් එකකට රු.320 බැගින් ගෙවීමට එකඟවී පළමු ලංසුකරුවම අවස්ථාව ලබාදී තිබුණි. මුල් ලංසු ප්‍රදානය අනුව ගෙවීමට එකඟ වූ මුදල රු.20,439,258ක් වුවද මිල වෙනස් කිරීම නිසා රු.27,836,420ක් ඇපයුම් කරුට ගෙවීම නිසා සමාගමට රු.7,397,161 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඈ) සමාගම විසින් සභාසනිගේ ආරක්ෂාව සඳහා රු. 405,956 ක් වටිනා ගිනි අවියක් මිලදී ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත අත්කිහාරම් වශයෙන් 2020 ඔක්තෝම්බර් 15 දින රු. 324,946 ක් ද 2021 මාර්තු 04 දින රු. 81,010 ක්ද ගෙවා තිබුණි. 2021 අප්‍රේල් 29 දින වන විට අදාල ගිනි අවිය සමාගමට ලැබී තිබුණද 2021 මැයි 10 දින වන විටත් භාණ්ඩ ලැබීම් සහතිකය (GRN) නිකුත් කර

නොතිබුණි. ඉහත මුදලට අමතරව 2020 සැප්තැම්බර් 30 දින cosmic technologies ආයතනයට මේ සඳහා අත්තිකාරම් වශයෙන් රු.100,000 ක් ද ගෙවා තිබුණි. එම ගෙවීම කුමක් සඳහාද යන්න විගණනයට අනාවරණය නොවූණි. එසේම ගිනි අවියක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න විගණනයට පැහැදිලි නොවුණි.

(ආ) සමාගමේ යන්ත්‍රාගාරය සඳහා වටිනාකම රු.73,165,328 ක් වූ Wet High Intensity Magnetic Separator with a Control Panel Board යන්ත්‍රය මිලදී ගැනීම් ක්‍රියාවලියේදී කළමණාකාරිත්වය විසින් කලට වේලාවට තීරණ නොගැනීම, පෙන්ඩර් ප්‍රදානය 2018 පෙබරවාරි 12 දක්වා ප්‍රමාදවීම, ණයවර ලිපි(LC) විවෘත කිරීම 2019 අගෝස්තු 12 දක්වා ප්‍රමාද වීම හා නියමිත දිනට මිල දී නොගැනීම ආදී දීර්ඝ ප්‍රමාදයන්ගේතුවෙන් අදාල කාල පරාසය තුළ ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් සමාගමට රු. 11,660,234 ක විනිමය පාඩුවක් දැරීමට සිදුවී තිබුණි.

(ඇ) වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ, පස් කපන යන්ත්‍ර, ට්‍රැක්ටර්, ලොරී, වාහන එන්ජින්, ස්පයිරල්, ට්‍රැක්ටර්, වෑන්, JCB 5 ක් පමණ හා වෙනත් යන්ත්‍ර ඇකාටස් යන්ත්‍රාගාර භූමියේ අනාරක්ෂිතව දමා තිබූ අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) යන්ත්‍රාගාරවලින් ඉවත්වන (සුදුවැලි) නොගවලට අමතරව පෙරසෑරි කරන ලද ඔනිපව්වලි නොග සමාගමේ විශාල භූමි ප්‍රදේශයක විවිධ ස්ථාන වල අනාරක්ෂිතව වසර කිහිපයක සිට ගොඩ ගසා තිබූ අතර එම වැලි නොග අලෙවි කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් භූමියේ ඉඩකඩ ඇනිරී තිබුණි.

(ඉ) එම්. වී. කොඩියැලිවී නෙකොරේ මූළු බර මෙ.ටො. 7,763ක් පමණ වන අතර ඉන් ඉවත්කරගෙන ඇති යකඩ ප්‍රමාණය මෙ.ටො. 3,120 ක් පමණ වේ. 2005 වර්ෂයේ සිට මේ වන විට වසර 16ක් ගතවී ඇතත් ගිවිසුම් ප්‍රකාරව ආශා ලංකා ආයතනය විසින් නැව ඉවත්කර නොගැනීම් හේතුවෙන් පරිසර හානියක් මෙන්ම මුල්මුදල් වියදම වරායේ කටයුතු ඇනහිටීමෙන් මූල්‍යමය පාඩුවක්ද, සිදුවී ඇත. 2014 වර්ෂයේදී එම් වූ ඉල්මනයිට නොගයෙන් කොටසක් ආශා ලංකා සමාගම විසින් ගොඩට ගෙන තිබූ අතර ඒවා අලෙවි කිරීමට හෝ ඉවත් කිරීමට ක්‍රියාමාර්ගයක් නොගෙන වසර 7ක් නිස්සේ සමාගම පරිශ්‍රයේ අනාරක්ෂිතව ගෙඩගසා පැවතුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2011 ජනවාරි 9 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගම විසින් රු. මිලියන 500 ක මුදලක් ඉහත සංස්ථා සේවක වන්දි ගෙවීම සඳහා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත 2012 ජනවාරි 10 දින ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මෙම ණය ප්‍රතිඵලයක් ලෙස රු.103,484,290ක අධිමාන ණය වෙත් කර තිබූ අතර රු.517,421,448 ක් වූ ණය මූදල හා පොලිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ පමණ ඔට වැවිලි සංස්ථාවට හා ජාතික කඩදාසි සංස්ථාවට ලබාදී තිබූ පිළිවෙලින් රු.25,000,000 හා 5,000,000 ක ණය මුදල් අය කරගැනීමට සමාගමට නොහැකිව තිබුණි.

(ඇ) 1990 මාර්තු 12 දින කර්මාන්ත අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලැබූ ප්‍රසාද දීමනා ගෙවීම පරිපාටියේ 6 - B ඡේදය ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීම කිරීම වර්ෂයේ ලාභය සඳහා කරගත යුතු බව දක්වා තිබුණද, එම පටිපාටියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ ලාභයක් නොලබා තිබිය දී ප්‍රධාන කාර්යාලයේ සේවකයින් සඳහා රු.10,300,000 ක් හා පුල්මුඩෙ යන්ත්‍රාගාරයේ සේවකයින් සඳහා රු.49,200,000ක්ද වශයෙන් මුළු එකතුව රු.59,500,000 ක් ප්‍රසාද දීමනා අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. තවද මේ සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේද, අමාත්‍යාංශයේද, භාණ්ඩාගාරයේ ද අනුමැතියක් නොවිය.

(ඈ) 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී ප්‍රධාන කාර්යාලයේ තනතුරු නාම 07ක නිලධාරීන් 13 දෙනෙකුගේ පුරප්පාඩුද, තනතුරු නාම 03 ක නිලධාරීන් 19 දෙනෙකුගේ අතිරික්තයක්ද නිරීක්ෂණය වූ අතර පුල්මුඩෙ යන්ත්‍රාගාරයේ තනතුරු නාම 12 ක නිලධාරීන් 119 දෙනෙකුගේ පුරප්පාඩුද තනතුරු නාම 04ක නිලධාරීන් 20 දෙනෙකුගේ අතිරික්තයක්ද නිරීක්ෂණය විය.

(ඉ) සමස්ථ ආයතනයේ නිෂ්පාදන, පරිපාලන, ගිණුම් හා අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්ති හා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර ස්ථිරව පිරවීමට කටයුතු කල යුතු වුවත් එසේ නොකර අදාළ තනතුර සඳහා ද්විතික පදනම මත නිලධාරීන් බඳවාගෙන තිබුණි.

(ඊ) 1997 දෙසැම්බර් 02 දින සිට පරිපාලන නිලධාරී තනතුර දරමින් සිටිය දී විනය පරීක්ෂණයකට අනුව චෝදනා 11 කට වැරදිකරු ලෙස නිගමනය ලද්දව 2017 සැප්තැම්බර් 15 දින සිට සමාගමේ සේවයෙන් පහකළ නිලධාරියකු සභාපතිවරයා විසින් සමාගමේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (මානව සම්පත්) තනතුර සඳහා 2020 අප්‍රේල් 01 දින සිට රු.120,000 ක මාසික දීමනාවකට ද, 2020 ඔක්තෝබර් 12 දින සිට අධ්‍යක්ෂ ජණ්ඩල තීරණ මත පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (HM1 -3) තනතුරේ වැඩ බැලීමටද පත් කර තිබුණු අතර අදාල නිලධාරියා වෙනුවෙන් 2020 අප්‍රේල් සිට 2021 මාර්තු දක්වා දීමනා ලෙස රු.2,052,898 ක් සමාගමෙන් ගෙවා තිබුණි. මෙම අයථා පත් කිරීම නිවැරදි කිරීමට හා ඒ වෙනුවෙන් කරනලද ගෙවීම් වගකිව්යුතු නිළධාරීන්ගෙන් අයකර ගැනීමට සමාගම මෙන්ම අමාත්‍යාංශයද කටයුතු කර නොතිබුණි.

(උ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ පෞද්ගලික සහකාර තනතුරට පත්කල නිලධාරියා හට සමාගමෙන් 2020 මාර්තු සිට 2021 පෙබරවාරි දක්වා දීමනා ලෙස රු.646,749 ක්ද, අතිකාල වශයෙන් 500,000 ක්ද පුල්මුඩේ ගමන් කිරීම සඳහා දිනකට රු.1000 බැගින් රු. 60,000 ක් ද වශයෙන් රු 1,206,749 ක් ගෙවීම් කර තිබුණි. මෙම තනතුර අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති තනතුරක් වන අතර අනිසි ලෙස බඳවා ගෙන ඒ වෙනුවෙන් කරනලද ගෙවන ලද වැටුප් හා දීමනා වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාගමේ උසස් කිරීම් පිළිබඳ සිදු කළ නියැදි පරීක්ෂාවේදී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට පටහැනිව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව සමාගමේ සභාපති විසින් නිලධාරීන්ට පෞද්ගලික වන ලෙස වැටුප් ක්ෂේත්‍ර වෙනස් කම්වලින් තනතුරු උසස් කර වැටුප් ගෙවා තිබුණි.

(එ) සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු වන ප්‍රධාන රසඳුන තනතුර වසර 10 ක සිටද ගෙවදා නිළධාරී තනතුර වසර 05 ක සිටද ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරී(මූල්‍ය) හා ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) යන තනතුරු 2019 අප්‍රේල් මස සිටද පූරණප්‍රාඩුව පැවතියද අදාල තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) අභ්‍යන්තර විගණන ඒකකය සඳහා ජ්‍යෙෂ්ඨ කලමනාකරණ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකු ඇතුළුව නිලධාරීන් පස් දෙනෙකු අනුයුක්ත කර තිබුණද, විගණන සැලැස්මට අනුව ප්‍රමාණවත් විගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) 2018 අංක 19 දරන විගණන පනතේ 38(ඊ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය පාලනය සඳහා සවිලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගනන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාව පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති එලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එවැනි සමාලෝචනයක් කල බවට නොරතුරු නොවිය. නවද විගණන පනතේ 40(4) වගන්තිය ප්‍රකාර අභ්‍යන්තර විගණන වාර්තා කළමනාකරණ විගණන අදහාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.ඒ. වික්‍රමරත්න
විගණකාධිපති

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය	සටහන	2020 රු.	2019 රු.
දළ **පිරිවැටුම**	**3**	**696,597,134**	**3,891,294,649**
එකතු කල අගය මත බද්ද		(313,473)	(293,162)
ශුද්ධ පිරිවැටුම		**696,283,661**	**3,891,001,487**
විකුණුම් පිරිවැය	**4**	(308,439,145)	(1,074,866,674)
දළ ලාභය		**387,844,516**	**2,816,134,813**
වෙනත් මෙහෙයුම් ආදායම්	**5**	494,864	75,066,614
		388,339,380	**2,891,201,427**
බෙදාහැරීමේ වියදම්	**6**	(9,011,171)	(7,691,761)
පරිපාලන වියදම්	**7**	(172,828,329)	(196,064,940)
වෙනත් මෙහෙයුම් වියදම්	**8**	(570,338,415)	(488,690,403)
		(752,177,915)	(692,447,104)
මෙහෙයුම් ලාභය		(363,838,535)	2,198,754,324
මූල්‍ය ආදායම්	**9**	313,041,206	78,991,726
වර්ෂයේ බදු පෙර ලාභය		**(50,797,328)**	**2,277,746,049**
ආදායම් බදු වියදම	**10**	119,675,183	(349,343,783)
වර්ෂයේ බදු පසු ලාභය		**68,877,855**	**1,928,402,266**
වර්ෂයේ ශුද්ධ ලාභය		**68,877,855**	**1,928,402,266**
කොටසක සාමාන්‍ය ඉපයීම	**11**	**0.86**	**24.10**
වර්ෂයේ ශුද්ධ ලාභය		68,877,854	1,928,402,267
විශ්‍රාම ප්‍රතිලාභ බැරකම් මත ශුද්ධ ආයු ගණන ලාභය/(අලාභය)		(30,482,690)	(11,311,837)
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**38,395,164**	**1,917,090,430**

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය		2020 රු.	2019 රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	12	1,087,467,636	937,897,694
කල්බදු වත්කම්	13	18,319,420	19,150,826
අස්පෘශ්‍ය වත්කම්	14	252,300	375,927
අත්තිකාරම්	15	453,937,158	505,679,303
මුළු ජංගම නොවන වත්කම්		**1,559,976,514**	**1,463,103,750**
ජංගම වත්කම්			
තොග	16	1,135,343,420	800,256,628
කෙටිකාලීන මූල්‍ය වත්කම්	17	98,686,497	161,146,234
ස්ථාවර තැන්පතු	18	2,293,478,814	2,486,530,643
අත්තිකාරම් සහ තැන්පතු	19	47,943,708	118,847,509
කලින් ගෙවූ වියදම්	20	55,553,182	32,671,441
වෙනත් ලැබිය යුතු දෑ	21	224,219,782	215,565,522
මුදල් හා මුදල් වලට සමාන දෑ	22	6,611,727	16,379,938
මුළු ජංගම වත්කම්		**3,861,837,130**	**3,831,397,915**
මුළු වත්කම්		**5,421,813,644**	**5,294,501,665**
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	23	800,000,000	800,000,000
රඳවාගත් ඉපයීම්/(අලාභ)	24	2,587,360,162	2,554,292,732
කොටස් හිමියන්ගේ මුළු හිමිකම		**3,387,360,162**	**3,354,292,732**
වගකීම්			
ජංගම නොවන වගකීම්	25	112,270,365	75,701,601
විශ්‍රාම පාරිතෝෂික බැඳීම	26	39,952,767	94,450,805
විලම්බිත බදු		**152,223,132**	**170,152,406**
ජංගම වගකීම්			
ගෙවිය යුතු ආදායම් බදු	27	142,400,411	236,659,500
වෙළඳ හා අනෙකුත් ණය හිමියෝ	28	1,644,731,215	1,347,632,579
වෙන්කිරීම් හා උපචිත වියදම්	29	68,981,302	160,269,331
කෙටිකාලීන ණය	30	19,701,366	25,495,116
බැංකු අයිරාව	31	6,416,057	----
ජංගම වගකීම්		**1,882,230,350**	**1,770,056,526**
මුළු වගකීම්		**2,034,453,482**	**1,940,208,932**
මුළු ස්කන්ධය හා වගකීම්		**5,421,813,644**	**5,294,501,665**

සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූල බව මම සහතික කරමි.

අත්සන් කලේ – සුජීවා කාරියවසම්
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබනු ලැබුවේ

අත්සන් කලේ - මුදිත විජේසිංහ
සභාපති

අත්සන් කලේ - ආර්. එම්. ජේ.උදයකුමාර
අධ්‍යක්ෂ

අත්සන් කළේ රංජිත් උපාලි
අධ්‍යක්ෂ

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

